අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

47 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord.Level) Examination, 2023(2024)

සිංහල සාහිත්‍ය රසාස්වාදය **I, II**
இலக்கிய நயம் சிங்களம் **I, II**
Appreciation of Sinhala Literary Texts **I, II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் – 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න**

විභාග අංකය : .....................................

උපදෙස්:

(i) I හා II පත්‍රය සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේ දී වෙන වෙන ම භාරදිය යුතු ය.

(ii) I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම ලිවිය යුතු ය.

(iii) II පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන පොත භාවිත කරන්න.

(iv) I පත්‍රය සඳහා ලකුණු 40ක් ද II පත්‍රය සඳහා ලකුණු 60ක් ද හිමි වේ.

**සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය**
(සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න).

01. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒ ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු, දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

(i) "බිසවුන් වහන්සේ තනි ව වැඩ සිටිනා සෙයින් වැද්ද නොහෙමි."

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

.................................................................................................................

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

.................................................................................................................

(ii) "මෙතෙක් බර උසුලා ගෙන දවස කෙතෙක් තැන් යවු දැ"

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?

.................................................................................................................

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

.................................................................................................................

(iii) "පියරු දැම්මට මුහුණේ ගඳ යනවා ද?"

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

.................................................................................................................

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

.................................................................................................................

(i) තිරසර ගුණෙන් යුතු උතුමකුහට පවර
සමුදුර සියල් කිඳලෙක තුඹසෙක සුනෙර
**පුවතර** මෙ දඹදිව මළුවෙක සිය ගෙදොර
**ඔහුකර** නො වන සැපතෙක් එබැවින් කවර

(අ) මෙම කවියේ මුල් පද දෙකෙහි අදහස ලියන්න.

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

පුවතර ..............................

ඔහුකර .............................

(ii) කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්.

ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්
'ඔබැ'රැ අන් කිසිවෙක් නිසි නැ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්.

(අ) මෙම පැදි පෙළ රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

.................................................................................................................

(ආ) " 'ඔබැ'රැ අන් කිසිවෙක් නිසි නැ' කියා......" යන පද්‍යා පාඨයෙහි අදහස ලියන්න.

.................................................................................................................

.................................................................................................................

02. පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

2. එසඳ මහාබෝධිසත්ත්වයෝ එසත් රජුන් අල්වා ඔවුනොවුන්ගේ උතුරු සළුවෙන් පිටිතල අයා බැඳගෙන ඒ රණ භූමියෙන් නොයෙක් ජයඝෝෂා පවත්වා ගෙන මාණික්‍ය රත්නයෙහි ආනුභාවයෙන් දිවිදළන් ඔප් නගා කරන ලද ස්වර්ණ ප්‍රතිමාවක් මෙන් විරාජමාන ව අනන්‍ය සාධාරණ ශ්‍රී විභූතියෙන් යුක්ත ව සුරසෙන් පිරිවරා සුජාතාවන් හා ඓරාවණ වාහනාරූඪ ව අසුර විජය කොට අවුත් වෛජයන්ත ප්‍රාසාදයට වදනා ශක්‍රදේවේන්ද්‍ර විලාසයෙන් මාළිගාවට වැද මද්දු රජ්ජුරුවන් දැක "මයිලණුවන් වහන්ස, නුඹ වහන්සේට විරුද්ධ ව අවුදින් නුවර වටලාගත් ශත්‍රු සේනාව මථනය කොට රජ දරුවන් සත් දෙනා ජීවග්‍රාහයෙන් අල්වා ගෙන ආමි, මොවුන් මරතත් මැරුව මැනව, හරිතත් හලමැනව, වහල්මේ ගනිතත් ගත මැනව, කැමැත්තක් කළ මැනවැ" යි කීහ.

එබස් අසා මද්දුරජ්ජුරුවෝ "මහරජ්ජුරුවන් වහන්ස අප ඇම දෙනාට ම ප්‍රධාන ව සිටි හෙයින් මොහු නුඹ වහන්සේට ම සතුරෝ ය. මරතත් තබතත් අරිතත් නුඹ වහන්සේට ම කැමැත්තක් කළ මැනවැ" යි කීහ. මද්දුරජ්ජුරුවන් විසින් මෙලෙස කී කල්හි මහා බෝධිසත්ත්වයෝ "මොවුන් මරා ලබන්නේ කිම් ද, මුන් හැම මේ නුවරට ආ ගමන් ව්‍යර්ථ නො වේවයි, ප්‍රභාවතීන්ගේ නගුන් සත් දෙනා රජදරුවන් සත් දෙනාට දෙවා ලමි" සිතා "දේවයන් වහන්ස, දිව්‍යප්සරාවන් සමාන රූප ශෝභා ඇති නුඹ වහන්සේගේ දූන් සත් දෙනා මෙරජ දරුවන්ට පාවා දී මුන් හැම බෑණ කොට ගත මැනවැ" යි කිවූ ය. එබස් අසා මද්දු රජ්ජුරුවෝ මහා රජ්ජුරු වහන්ස, අපටත් උන්ටත් නුඹ වහන්සේ ම ප්‍රධාන සේක. ඉදින් කැමති සේක් වී නම් දෙවා වදාළ මැනවැ" යි කිවූ ය.

I. මේ උද්ධෘතයේ ඇතුළත් උපමා දෙකක් උපුටා දක්වන්න.

.................................................................................................................

.................................................................................................................

II. මහා බෝධිසත්ත්වයන් සත් රජවරුන් අල්වා ගැනීමෙන් අනතුරුව කළ කාර්යය කුමක් ද?

.................................................................................................................

.................................................................................................................

III. මහා බෝසතාණන් තමා අල්වා ගෙන පැමිණි රජදරුවන් සත් දෙනා සම්බන්ධයෙන් මද්දු රජුට කළ ප්‍රකාශයත් එයට මද්දු රජු දුන් පිළිතුරත් විස්තර කරන්න.

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

IV. අවසානයේ සත් රජවරුන් සම්බන්ධයෙන් මහා බෝසතාණන් කළ යෝජනාවත් එයට මද්දුරජුගෙන් ලැබුණු ප්‍රතිචාරයත් ලියන්න.

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

නැතහොත්

වැහි වලා කුළ, පෑ කළු යෑ යි ඔබේ
නො හොබිති යි කිසි ලෙස් නොසතොස් නොවන්
සිරුරු පැයෙනු'ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා.

පැනැ - නැඟී අහසේ පැතිරී ගොසින්,
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්,
කුඹුරු - වැව්-පොකුණුත් පුරවා දියෙන්,
ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්.

නද අසා ඔබ ගේ පැහැයත් බලා,
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්.
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
තුරු ලියත් ලිය -ලයි සැනැසී දියෙන්.

**සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ**
**ඉහළ යෙයි; ඔබ යැම පහත් වැ මැ යි**
**එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ**
**ගුණ බරින් නැමුණෝ'වි පවතිත් නිතින්.**

කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්.

ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්
'ඔබැ'රැ අන් කිසිවෙක් නිසි නැ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්.

(i) වැහි වලා කුළ සොබා දහමේ පැසසුමට ලක් වන්නේ කවර ආකාරයෙන් ද?

.......................................................................................................................

.......................................................................................................................

(ii) උතුමන් හා වාසයෙන් නිවටයන් ද උසස් වන බව දැක්වීමට කවියා යොදා ගෙන ඇති යෙදුම කුමක් ද?

.......................................................................................................................

(iii) තද කළු අකුරින් මුද්‍රිත පද්‍යයෙන් ඇඟවෙන අදහස කෙටියෙන් විස්තර කරන්න

.......................................................................................................................

.......................................................................................................................

(iv) කළු පැහැය පිළිබඳ ව සමාජයේ පවතින ආකල්ප අර්ථශූන්‍ය බව දැක්වීමට කවියා උත්සාහ ගෙන ඇති අයුරු කෙටියෙන් විස්තර කරන්න

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

**47 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord.Level) Examination, 2023(2024)

| | |
|---|---|
| සිංහල සාහිත්‍ය රසාස්වාදය | **I, II** |
| இலக்கிய நயம் சிங்களம் | **I, II** |
| Appreciation of Sinhala Literary Texts | **I, II** |

**සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය**

- පළමුවන ප්‍රශ්නය ද, 2, 3, 4, 5 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

1. පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් කරන්න.

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු

බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ මිස
එ සඳ ඔබේ මුව'ග නැගුණු සාද තෙපුල් නෑසේ මට

මේසය මත ලිපි ගොනු රුස සුළඟෙ නොයා දී රකිමින්
ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය ඔබ

බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස බලා සිනා නගයි

බාලේ අපි ගම් දොර කෙළි මඩුලු මැදින් ආ ගමනේ
මහදේ ඇඳි ඔබෙ සිතුවම කොහි සැඟවිණි දැයි නොදැනේ

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
ඔබ අසලින් බැහැරට යමි කුමට ද ඔබගෙන් අවසර?

(අ) මේ පැදිපෙළට පාදක වූ අත්දැකීම

(ආ) ඒ අත්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් අවස්ථා

(ඉ) භාෂා භාවිතය

(ඊ) පුද්ගල චර්යා නිරූපණය

(උ) මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති වෙනත් කරුණු

02. පාඨක සිත් බැඳගන්නා ලෙස සිද්ධි පෙළ ගැස්වීමට සද්ධර්මරත්නාවලි කතුවරයා දක්වන කුසලතාව නන්ද මහා තෙරුන්ගේ වස්තුවෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න.

03. තුංමං හංදිය නවකතාවේ අබිලිංගේ චරිතයෙන් හෙළි වන්නේ ගැමියන්ගේ නිර්ව්‍යාජ සිතුම් පැතුම් ය. උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න.

04. "වැලපීම" කෙටිකතාව නිර්මාණය කිරීමේ දී තේමාවට උචිත පරිසරයක් යොදා ගැනීම එහි සාර්ථකත්වයට හේතු වී ඇත. උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න.

05. මුල් කවි පද දෙකෙහි ප්‍රකාශිත සදුපදේශය වඩාත් තහවුරු කර දැක්වීමට ඉතිරි පද දෙක යොදා ගැනීම සුභාෂිතයේ දක්නට ඇති විශේෂ ලක්ෂණයකි. උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
සිංහල සාහිත්‍ය රසාස්වාදය

I පත්‍රය - **පිළිතුරු**

01. (i) (අ) රන්කරුවා විසින්
(ආ) බෝධිසත්ත්වයන්ට / කුස කුමාරයාට

(ii) (අ) කොටළු දෙන
(ආ) කොටළුවාට

(iii) (අ) අයියා/ කථකයා
(ආ) නංගීට

(iv) (අ) උතුම් වූ ස්ථිරසාර ගුණවලින් යුක්ත උතුමකුට මහත් සාගරය කුඩා දිය කඩිත්තකි. මහා මේරු පර්වතය තුඹසෙකි.
(ආ) පුවතර මහත්/ විශාල
ඔහු කර ඔහුගේ අතට/ හස්තයට

(v) (අ) කුමාරතුංග මුනිදාස
(ආ) ඔබ හැර අන් කිසි කෙනෙක් සුදුසු නැති බව

02. (i) * ස්වර්ණ ප්‍රතිමාවක් මෙන්
* ශක්‍රදේවේන්ද්‍ර විලාසයෙන්
* දිව්‍යාප්සරාවන් සමාන
උපමා දෙකක් ලිවීම ප්‍රමාණවත් ය.

උදාහරණයකට ලකුණු 2 බැගින් ලකුණු 04 යි.
(ලකුණු 04 යි)

(ii) සත් රජවරුන් ඔවුනොවුන්ගේ උතුරු සළුවෙන් පිටිතල හයා බැඳ ඔවුන් ද රැගෙන මද්දු රජුගේ මාලිගාවට පැමිණීම

(ලකුණු 04 යි)

(iii) මොවුන් මැරීමට හෝ නිදහස් කොට යැවීමට හෝ වහල්භාවයට ගැනීමට හෝ කැමැත්තක් කරන ලෙස මහාබෝසතාණෝ මද්දු රජුට ප්‍රකාශ කළහ.

එයට පිළිතුරු වශයෙන් මොවුන් නුඹ වහන්සේට සතුරන් බැවින් මරතත්, තබතත්, අරිතත් නුඹ වහන්සේට ම කැමැත්තක් කරන ලෙස මද්දු රජු ප්‍රකාශ කෙළේ ය.

කොටස් දෙකට ලකුණු 03 බැගිනි.
(ලකුණු 06 යි)

(iv) පභාවතියගේ නැගණියන් සත් දෙනා මේ රජවරුන් සත් දෙනාට පාවා දී මේ හැම දෙන තමන්ගේ බෑනාවරුන් කර ගන්නා ලෙස මහබෝසතාණන් යෝජනා කළ අතර, තමාටත්, එම රජදරුවන්ටත් මහාබෝසතාණන් ප්‍රධාන වන බැවින් එලෙස කිරීම සුදුසු බව මද්දු රජු තම කැමැත්ත ප්‍රකාශ කෙළේ ය.

කොටස් දෙකට ලකුණු 03 බැගිනි.
(ලකුණු 06 යි)

**නැතහොත්**

(i) විදුලියක් පැහැපත් රන දම් සෙයින් ගෙලෙහි පැලඳවීම/ විදුලිරේඛා වැහි වලා කුළ මත පතිත වීම
(ලකුණු 04 යි)

(ii) කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ කරදිය කළු වලා කුළ, සාගරයෙන් ගත් කළ මිහිරි බවට පත් වෙයි.
කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කරදියත් ඔබ ගත් කලැද සාගරෙන්
මිහිරි වෙයි.

(ලකුණු 04 යි)

(iii) සුදු වලා කුළ අහස් කුසේ බොහෝ ඉහළට යයි. කළු වලා කුළ යනුයේ පහත්ව ය. එය පුදුමයක් ද? උසස් ගුණවත් දනෝ / මිනිස්සු ගුණ බරින් නිරන්තරයෙන් ම නැමී පවතී.

කෙටියෙන් විස්තර කිරීම අවශ්‍ය ය.

(ලකුණු 06 යි)

(iv) * වැහි වලා කුළ කළු වූවාට නො සතුටු නො වන ලෙසත් උතුමන් ගුණයෙන් මිස සිරුරු පැහැයෙන් හඳුනා ගත නො හැකි බවත්,
වැහි වලා කුළ, පෑ කළු යැ යි ඔබේ
සිරුරු පෑයෙනු'ගත් සුදනෝ ලොවේ

* සුදු වලා කුළ අහසේ ඉහළයට යන ආකාරයත්, කළු වලා කුළ පහත් ව යාම උසස් නැණවත් දනන් ගුණ බරින් නැමෙන ආකාරයත්,

සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ,
ඒ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ

වැනි කරුණු දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය.

(ලකුණු 06 යි)

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
සිංහල සාහිත්‍ය රසාස්වාදය

II පත්‍රය - පිළිතුරු

01. (අ) මේ පැදි පෙළට පාදක වූ අත්දැකීම

මේ පැදිපෙළට පාදක වී ඇත්තේ මිතුරකු විසින් ස්වකීය මිතුරකුට අතීතය ආවර්ජනය කර දීමේ සිදුවීමකි. මිතුරන් දෙදෙනකුගෙන් එක් අයෙක් උසස් අධ්‍යාපනය ලබා දිසාපතිවරයකු බවට පත් වෙයි. අනෙක් මිතුරා කලකට පසු ඔහු හමු වීමට පැමිණෙයි.

- ‘එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
  දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු’

එහෙත් දිසාපතිවරයා ස්වකීය පැරණි මිතුරා ගණනකට නො ගනියි. එහි ප්‍රතිඵලයක් ලෙස උරණ ස්වභාවයකින් ඔහු දිසාපතිවරයා වෙතින් නික්මෙයි. කල්‍යාණ මිත්‍ර සම්බන්ධය පිළිබඳව ද මෙහි කියවේ.

අත්දැකීම විස්තර කර ඇත්නම් ලකුණු 04යි.
උදාහරණය ලබා දී ඇත්නම් ලකුණු 02යි.
(ලකුණු 04+02=06යි.)

(ආ) එම අත්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් අවස්ථා

මේ සඳහා කවියා ස්වකීය මිතුරාගේ කාමරයේ ඇති අවස්ථා සජීව ආකාරයෙන් නිරූපණය කර තිබේ.

දිසාපති කාමරයේ ඇති සජීව වස්තුවලින් නැඟෙන හඬ කන වැකෙන අවස්ථාව

- බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ මිස

දිසාපති කාමරයේ ඇති අජීව වස්තු තමා දෙස බලන බව හැඟෙන අවස්ථාව

- බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි

තමා අබියස සිටියත් මිතුරා නිහඬව සිටින ආකාරය

- ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය ඔබ

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.

උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.
අදාළ විස්තරයට ලකුණු 03යි.
(ලකුණු 03+03=06)

(ඉ) භාෂා භාවිතය

සරල භාෂා භාවිතයක් දැක ගත හැකි ය. ඇතැම් වචන කට වහරේ සුභාවිතය.

- ‘බාලෙ අපි ගම් දොර’
- ‘දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු’

කාව්‍යාලංකාර/උපමා භාවිතය

- ‘ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය ඔබ’

වියත් වහර යෙදීම

- සරතස, සුමිතුර, කෙළි මඬුලු

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.

උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.
අදාළ විස්තරයට ලකුණු 03යි.
(ලකුණු 03+03=06)

(ඊ) පුද්ගල චර්යා නිරූපණය

මෙහි නිරූපණය වන්නේ පුද්ගලයන් දෙදෙනකු පමණි. ඉන් අයෙක් දිසාපති කෙනෙක් ය. අනෙකා තවමත් ගැමියෙකි. මොවුන් දෙදෙනාගේ චර්යා නිරූපණය කර තිබේ.

ස්වකීය තත්ත්වයෙන් උඩඟු වූ ස්වභාවය

- ‘ඒ සඳ ඔබේ මුව‘ග නැගුණු සාද තෙපුල් නැසේ මට’

අතීතය අමතක කළ පුද්ගල ගති ස්වභාවය

- ‘මහදේ ඇදී ඔබෙ සිතුවම’

ඕනෑ ම පුද්ගලයකු වෙනස් විය හැකි ය යන පුද්ගල ස්වභාවය හඳුනා නො ගෙන තරහ සිත් ඇති කර ගැනීම

- ඔබ අසලින් බැහැරට යමි කුමට ද ඔබගෙන් අවසර

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.

උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.
අදාළ විස්තරයට ලකුණු 03යි.
(ලකුණු 03+03=06)

(උ) මේ පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති තවත් කරුණු

- කාව්‍ය ආකෘතිය
  මෙම පද්‍ය නිර්මාණය සඳහා දෙපද ආකෘතිය යොදා ගෙන තිබේ.
  මේ හේතුවෙන් තාලාත්මක භාවයක් ලැබී ඇත. පද්‍ය පන්තියේ සුදුසු කවිවලින් උදාහරණ ගත හැකිය.
- සමාජ දෘෂ්ටිය
  පවත්නා ආධ්‍යාපනික රටාව මඟින් විපර්යස්ත පුද්ගල මනෝභාව නිරූපණය වී තිබීම. දිසාපතිවරයාගේ නිහැඩියාව එය නිරූපණය කරයි. ඔහු ස්වකීය මිතුරා සමග පෙර මෙන් බැඳීමක් නොමැති බව ද පෙනෙයි. සුදුසු කවිවලින් උදාහරණ ගත හැකි ය.
- ජීවන දෘෂ්ටිය
  දිසාපතිවරයකු යනු කාර්ය බහුලත්වයෙන් හා රාජකාරි වශයෙන් වගකීම් රාශියකින් පීඩිත අයෙකි. ඔහු හමු වීමට පැමිණි මිතුරාට එවැනි පීඩිත තත්ත්වයක් නොමැත. මෙහි දී දිසාපති කාමරයට පැමිණ රාජකාරි අතර ඔහුගෙන් සෑද තෙපුල් බලාපෙරොත්තු වීම සාධාරණ නො වේ. අනෙකා කෙරෙහි ද සාධාරණ අන්දමින් සිතිය යුතු ය. සුදුසු කවිවලින් උදාහරණ ගත හැකි ය.

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.

උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.
අදාළ විස්තරයට ලකුණු 03යි.
(ලකුණු 03+03=06)

02. * බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කිරීම
* නන්ද කුමරු මහණ කිරීම දක්වා සිදුවීම්
* නන්ද කුමරු සිවුරු හැර යාමට තීරණය කිරීම හා බුදුරජාණන් වහන්සේ එය වළක්වාලීමට ගත් ක්‍රියාමාර්ග
* නන්ද කුමරු රහත් භාවයට පත් වීම

වැනි කරුණු විස්තර කරමින් පිළිතුරු ලියා තිබිය යුතු ය.

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.
උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.
අදාළ විස්තරයට ලකුණු 03යි.
(ලකුණු 03+03=06යි)

03.

- හිම කැට වැටෙන සීතල රාත්‍රියක් තුළ කතාව විකාශනය වේ.
- ඇඳිරි යාමයයි. නොබෝ වේලාවකට පෙර පහන් සිසාරා ඝන හිමකැට වැටෙමින් ගෙවල්වල පියසිත් අශ්වයන්ගේ පිටවලුත් මිනිසුන්ගේ හිස් වැසුමුත් වසාගෙන තුනී තට්ටුවක් ව පවතියි.
- ඔහු ඉන්නේ හිම කන්දක් තමා වෙත කඩා වැටුණත් ඉන් ගැලවීමට උවමනාවක් නැත්තකු ලෙසිනි.
- අඳුරේ අතුරුදහන් ව යන ඔවුන් දෙස ඉයෝනා බලා සිටියි. නැවත වරක් නිසංසලභාවය හුදකලා වූ ඉයෝනා ගිල ගනියි.

- පැය එකහමාරකට පමණ පසු අපිරිසිදු ගිනි උඳුනක් අසල වැද හොවියි. ගිනි උඳුන අසල බිමත් බංකු උඩත් මිනිස්සු ගොරවමින් සිටිති.

ඉහත උද්ධෘත තුනක්වත් ඇසුරෙන් ඉයෝනාගේ පුතාගේ මරණය පිළිබඳ ඔහුගේ හිතේ පැවති ශෝකය කතුවරයා නිරූපණය කර ඇති ආකාරය විස්තර කර තිබේ නම් අදාළ ලකුණු ප්‍රදානය කරන්න.

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.

උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.

අදාළ විස්තරයට ලකුණු 03යි.

(ලකුණු 03+03=06යි)

04. * මේ විදියට පිරිත් පිංකමක් වූ දාට පිරිත් මණ්ඩපයත්, මරණ ගෙයක් වූ දාට තුම්බරයත් සැරසීම සිදු වන්නේ මාමාටය. මේ සැරසිලි වැඩ සඳහා මාමා මහන්සියක් අය නො කරයි.

- * ඔහු ගන්නේ කඩදාසි සඳහා යන වියදම පමණකි.
- * මාමා මොහොතක් නිකම් නො ඉඳී. මොකක් නමුත් වැඩක් කරයි.
- * මා සරුංගලය අරගෙන දුවන විට එය කැරකෙන හැටි මාමා බලා සිටී.
- * වියදම් කිරීමට මුදල් ලොකු මාමාට නැත. එහෙත් මහන්සි වී වැඩ සියල්ල ඔහු දුව පැන කරයි.
- * පිංකම සඳහා එතැන් පටන් ලොකු මාමා බොහෝ වෙහෙස මහන්සි විය.
- * ඔහු කිරිඳිවැලට ගොස් පිංකම ගැන දැන්වීම් පත්‍රිකා මුද්‍රණය කරවා හතර පේරුව පුරාම ප්‍රසිද්ධ කර හැරියේ ය.

ඉහත උදාහරණ හෝ වෙනත් සුදුසු උදාහරණ ලියා ඇත්නම් පිළිගන්න.

අබිලිංගේ නිර්ව්‍යාජ ගති ලක්ෂණ උදාහරණ මගින් පැහැදිලි කර තිබීම අවශ්‍ය ය.

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතුය.

උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.

අදාළ විස්තරයට ලකුණු 03යි.

(ලකුණු 03+03=06යි)

05. * නැගෙතත් අවර ගිරගින්' දිනකර මඬල

- * කොතෙක් වෙහෙස ලදුවත් සුදනෝ පවර
- * පින්මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු
- * විපුල ගුණැති මහතුන් හට පත් විපත
- * කුලුණු ගුණින් යුතු උතුමන් සිත මහරු
- * දියනෙත උදා වන සිය කිරණින් මහරු
- * රුදුරු ගිනි කඳක් ගත් සඳෙහි වන'තුරු

වැනි උදාහරණ හෝ සුදුසු වෙනත් උදාහරණ හෝ දක්වමින් පිළිතුරු ලියා තිබීම අවශ්‍ය ය.
කවියේ දැක්වෙන සදුපදේශයත් එය තහවුරු කිරීම සඳහා යොදා ගෙන ඇති යෙදුමත් පැහැදිලි ව දක්වා තිබිය යුතු ය.

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.

උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.

අදාළ විස්තරයට ලකුණු 03යි.

(ලකුණු 03+03=06යි)